# ජාතික අධ්‍යාපන ආයතනය
# පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
# පූර්ණ කාලීන 2021 - සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

## ඩිප්ලෝමා පාඨමාලාව

පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, අධ්‍යාපන ආයතන කළමනාකරණය හා සංවර්ධනය කිරීමට අවශ්‍ය නායකත්ව හා කළමනාකරණ දැනුම, නිපුණතා හා ආකල්ප ලබා දීමට සම්පාදනය කර ඇත. එය න්‍යායාත්මක අධ්‍යයන සහ පර්යේෂණ නිබන්ධනයකින් යුක්ත වේ.

## පාඨමාලාව පැවැත්වෙන ස්ථානය

අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක

## පාඨමාලා කාලසීමාව

පූර්ණ කාලීන-අවුරුදු එකයි. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යය (අධ්‍යයන වාර 03 කින් පැවැත්වේ)

2021 මාර්තු මස පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂිතය.

## අයදුම් කිරීම සඳහා සුදුසුකම්

අයදුම් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය / විදුහල්පති සේවය / ගුරු අධ්‍යාපනඥ සේවයට

   අයත් වීම/පිළිගත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙකු වීම හෝ පරිවේනාධිපති තනතුරක් හෙබවීම

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය

   හෝ

   පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් වෙනත් විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව/පුහුණු ගුරු සහතිකය හෝ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වැනි වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

iii. අවම වශයෙන් අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු දෙකක්වත් පරිපාලන හා අධීක්ෂණ කටයුතුවල නිරතව සිටීම.

iv. තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේ දී (2021) ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් අධ්‍යාපන ආයතනයක හෝ කිසිදු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටීම.

v. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අදාළ සියලු මූලික සුදුසුකම් සපුරා තිබීම.

## බඳවා ගැනීමේ ක්‍රමය

සියලුම අයදුම්කරුවන් අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුය.

## අයදුම් කරන පිළිවෙළ

ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියේ (www.nie.lk/olcpgdem21app.aspx) ඇති මාර්ගත පෝරමය පුරවා එවිය යුතුය. තවද ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියේ (www.nie.lk) ආදර්ශ ඉල්ලුම් පත්‍රය (ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ), ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් **ගිණුම් අංක 70411168**ට අයදුම්පත් ගාස්තු රු. 250.00 ක් බැරකොට ලබාගත් ලදුපත සමඟ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අධ්‍යක්ෂ,**

**වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව,**

**අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,**

**ජාතික අධ්‍යාපන ආයතනය,**

**මීපේ හන්දිය, පාදුක්ක.**

ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ උඩ වම් කෙළවරේ - PGDEM Full Time 2021 (Sinhala/Tamil/English) යනුවෙන් සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2021 ජනවාරි මස 31

## ගාස්තු

පාඨමාලා ගාස්තුව - රු. 60,000.00, ලියාපදිංචි ගාස්තුව රු. 1,000.00

මෙම මුළු මුදල ලියාපදිංචි වන අවස්ථාවේ දී හෝ පහත සඳහන් ලෙස පාඨමාලා ගාස්තු කොටස් දෙකකින් හෝ ගෙවිය හැකිය.

1. 50 % ලියාපදිංචි වන අවස්ථාවේදී සහ
2. 50% ලියාපදිංචි වී මාස 06 ක් ගත වීමට පෙර

(සැලකිය යුතුයි - ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වුවහොත් අයදුම්පත් ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ).

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම